


2

අමන්දි නිවසින් පිටව ගිය මොහොතේ සිට නිමන්ත සිටියේ නොසන්සුන් සිතකින් ය. ඔහු කීප වතාවක් ම ඇගේ ජංගම දුරකථනයට ඇමතුමක් ගන්නට වෙහෙසුණේ ය. එය දිගටම ක්‍රියා විරහිත බව ස්වයංක්‍රීය පණිවුඩය කියයි.

හිත එකලස් කර ගත නොහැකි ය. ඔහු තම සේවා ස්ථානයට කතා කොට සේවයට නොපැමිණෙන බව පවසා නැවතත් ඇඳෙහි ඇල වුණේය. මේ සා අභාග්‍ය සම්පන්න ඉරණමකට මුහුණ දෙන්නට සිසුවීම ඔහුට දරාගත නොහැකි බරක් සේ දැනෙයි. මීට වසර කිහිපයකට පෙර අමන්දි තම ජීවිතයට සතුටත්, සැනසීමත්, වාසනාවත් රැගෙන ආ හැටි ඔහුට සිහි වෙයි. මේ වසර කීපය කෙතරම් සුන්දර වී ද?

"..අපි රියැලිටි එකට මුහුණ දෙන්න ඕනෙ නිමන්ත.." දොස්තර සිරිමාන්න ගේ වදන් සිත තුළ රාව ප්‍රතිරාව දෙන්නාක් මෙන්ය.

ඔහු කියන්නේ සැබෑවක් බව නිමන්ත දනියි. කළ යුතු බුද්ධිමත් ක්‍රියාව යාතාර්ථයට මුහුණ දීම සඳහා හිත එකලස් කර ගැනීම වුව ද හදවත එයට ඉඩ නොදෙයි. උහුලාගත නොහැකි මහා බරක් පපුව මත තැබුවාක් මෙන් රිදුම් දෙයි. ඒ බරින් ජීවිතයම කුඩු පට්ටම් වී යනු ඔහුට දැනෙයි.

බිත්තියේ සවි කර ඇති සිනාසෙන කුඩා දරුවා ගේ රූපය නිමන්තට පෙනෙයි. මාස කීපයකට පෙර දිනෙක එය මිලට ගෙනාවේ අමන්දි ය.

"එකක් මදි අමා... පහක් වත් ඕනෙ මට.." ඔහු ඒ සුන්දර රූපය බිත්තියේ එල්ලුවේ ඇයට කවට කම් කරමින් ය.

"පිස්සා.. පුංචි පවුල රත්තරන් කියලා අහලා නැද්ද..?"

සුන්දර පවුලක් පිලිබඳ සුන්දර සිහිනය කෙසේ නම් මේ තරම් ඉක්මණින් සිතින් ඉවත් කර ගන්නදැයි නිමන්තට නොදැනෙයි.

"..අමන්දිට සතුටින්, සැහැල්ලුවෙන් ඉන්න ඉඩ දෙන්න.. ඒක මේ වගේ ලෙඩෙකුට ගොඩාක් ප්‍රයෝජනවත් නිමන්ත.. මානසික තත්වය මේ වගේ ලෙඩ වලට ගොඩාක් බලපානවා.. ඔයා ඇත්තටම අමන්දිට ආදරේ නම් මේ වෙලාවෙ ඔයාට එයා වෙනුවෙන් යම් කැප කිරීමක් කරන්න වෙනවා.." වෛද්‍ය සිරිමාන්න තමාට පමණක් කියූ දෑ නැවත නැවතත් නිමන්තට සිහි වෙයි.

අමන්දි වෙනුවෙන් ඒ කැපකිරීම කරන්නට තමාට හැකි බව නිමන්ත දනියි. එය කළ යුතුම දෙයකි.

000000

අමන්දි බෝ සෙවණෙහි සුදු වැලි මළුවෙහි වාඩි වී සිටියා ය. මොහොතකට සියල්ල අමතක වූවා සේ ය. මඳ පවනට සැළෙන රත් පැහැ ළා දළු බෝපත් ගතටත්, සිතටත් සිසිලසක්ම එක් කරයි.

සුළඟ හා මුසුව එන බෝපත් ගීතය සිත නිවා දමයි. විහාර බිම හරහා හමා යන සුවඳට එක් වුණ හඳුන්කූරු සුව ද සිතට ඇති කරන්නේ මහත් ප්‍රබෝධයකි. සිත සන්සුන් කර ගන්නට මෙතරම් සුවදායක තැනක් තවත් කොතැන වේද?

සිත එක්තැන් කර ගනිමින් තම දෛවයට මුහුණ දීමට සුදුසුම පරිසරය මෙය ය. මේ අපූරු පරිසරයේදී සිතේ ජනිත වන ශක්තිය වෙන කොතැනකදීවත් ලබා ගත නොහැකි ය. කාලය පිළිබඳ තැකීමක් නොකර ම අමන්දි ඒ සුවදායී පරිසරයේ වාඩි වී සිටියා ය.



මවගේ අතින් මිදී වැලි මලුව හරහා දුව ආ කුඩා දරුවකුගේ කටහඬින් දැහැන බිඳෙත් ම අමන්දිට නිමන්ත සිහි විය. ඔහු මහත් කණගාටුවකින් වැඩට යන්නට ඇත.

ආපසු යා යුතු යයි එක වරම ඇගේ සිත කීවේ ය. ඔහුට අකරුණාවන්ත විය යුතු නැත. තමා සේම ඔහු ද පීඩාවට පත්ව සිටින බව අමතක නොකළ යුතු ය. අමන්දි වහා පඩි පෙළ බැස කාරය වෙත ආවා ය.

අමන්දි නිවසට ඇතුළු වන විටත් නිමන්ත සිටියේ මේසයට හිස ගසා ගත්වනම ය. ඉදිරි දොර ඇරෙන ශබ්දය ඔහුට ඇසුණි. නිමන්ත දැකීමෙන් අමන්දි විමතියට පත් වූවා ය.

"..අමා.. කොහේද ගියේ.. ඇයි මෙහෙම නොකියම ගියේ... පිස්සු වැඩ කරන්න එපා.." අමන්දි යමක් අසන්නට පෙරම නිමන්ත කීවේ ය. අමන්දි දොර අසළ නැවතී බලා සිටියා මිස යමක් කියන්නට උත්සාහ නොකළේ ය. ඔහු ඉදිරියට පැමිණ ඇගේ දෙළරහිසින් අල්ලා ගත්තේ ය. "..මේ ප්‍රශ්නෙ ඔයාගෙ විතරක් නෙමෙයි.. මේ අපි දෙන්නටම අයිති ප්‍රශ්නයක්.. මේකට අපි දෙන්නම එකට මුහුණ දෙන්න ඕන.. හැමදාම හිටියා වගේ ඉස්සරහටත් අපි එකට ඉන්න ඕනේ..."

නිමන්ත ගේ ආවේගශීලී හැඟීම් ඉදිරියේ තමා තව දුරටත් අසරණ වන බවක් අමන්දිට දැනුණි. ඈ තම දෙළර මත රැඳි ඔහුගේ දෑත් අපහසුවෙන් ඉවත් කළා ය.

"නෑ නිමන්ත .. මට මේ ගමන තව දුරටත් ඔයා එක්ක යන්න බෑ. ඒ ගමන මම තනියම යන්න ඕන. ඒකට මට බාධා කරන්න එපා ප්ලීස්.."

"පිස්සු කතා කියන්න එපා අමා .."
"ප්ලීස්.. ලීව් මී අලෝන්.."

ඇය ඉහළ මාලයට යන තරප්පු පෙළ නැග්ගාය.

"අමන්දි.." නිමන්තගේ දැඩි හඬ ඇය පිටුපසින්ම ඇයට ඇසුණි.

ඇය තම අත්බෑගය ඇඳ මතට විසිකර දැමුවා ය. ඇඳ මත වාඩි වී දෙදණ මත තබාගත් කොට්ටයකට මුහුණ ඔබා ගත්තා ය. නිමන්ත කාමරයට ඇතුල්වනු ඇයට ඇසුණි.

"මේ උදේ පාන්දර ඔයා කොහේද ගියේ කියන්න.." ඔහු ඇසුවේ ඇඳේ ඇය අසළින් වාඩි වන අතර ය. ඔහු කෝපයෙ-න් කතා කරන්නේ යයි ඇයට සිතුණි. ඈ හිස හරවා ඔහු දෙස බැලුවා ය.

"..එළියට බැස්සෙ යන තැනක් ගැන හිතාගෙන නෙවෙයි... ඒත් පස්සෙ මං නැවතුනේ කැළණි පන්සල ළඟ... ඒක හොඳ ගමනක්... මගේ හිතට ඒක ලොකු සහනයක් වුණා.." ඈ සුසුමක් හෙලුවා ය.
"..මම හිතුවා ඔයා ඔෆිස් යන්න ඇති කියලා..."

"ඔෆිස්..?? ඔෆිස් ගිහින් මම කොහොම හිත හදා ගෙන වැඩ කරන්නද.. ඔයා ගිය තැනක්වත් නොදැන.." පෙර දී නම් මෙවන් වෙලාවක ඇය සිනාසී ඔහුගේ සිත සැනසෙන කවට කමක් කරනු නියත ය. එනමුදු අමන්දි කිසිවක් නොකීවා ය. ඇගේ මුහුණේ රැඳී තිබූ මඳ සිනාව ද අතුරුදන්ව ගියා සේ නිමන්තට දැනුණි.

අමන්දි ඇඳෙන් නැගී සිටියා ය. අනතුරුව ඇඳුමක්ද අතැතිව නාන කාමරයට වැදී දොර වසා ගත්තාය. නාගන්නට අවශ්‍යතාවක් නොතිබුණ ද ඈ බොහෝ වේලාවක් වතුර මල යටට වී සිටියා ය. දෑසින් ගලා ආ කඳුළු දිය පාරට සේදෙන්නට හැර ගල් පිළිමයක් සේ සිටගෙන සිටියා ය.

නාන කාමරයෙන් පිටතට එන විට නිමන්ත ඇඳෙහි ඇලවී ගත්වන ම සිටිනු ඈ දුටුවා ය. ඔහුට නින්ද ගොස් ඇතැයි ඈ අනුමාන කළා ය. ඔහු දෙස නොබලන්නට පරිස්සම් වෙමින් ඈ කාමරයෙන් පිටවූවා ය.

තමා උදෑසන සාදා තිබූ තේ කෝප්පය තවමත් මේසය උඩ තිබෙනු අමන්දි දුටුවා ය. ඕ එය අතට ගත්තා ය, නිවී ගිය තේ කෝප්පය සෝදන බේසමට හැලුවා ය. නිමන්ත කෙරෙහි හටගත් අනුකම්පාව ඇගේ සිත රිදවූයේ ය.